# අධිමානෝවිද්‍යාව පිළිබඳ ලුහුඬු විවරණයක්

මහාචාර්ය පූජ්‍ය නාඹටුන්නේ විමලඥාණ හිමි[1]

## Abstract

Parapsychology is a field of research that studies a number of ostensible paranormal phenomena, including telepathy, precognition, clairvoyance, psychokinesis, near-death experiences, reincarnation, and apparitional experiences. This short paper aims to provide a broad definition of Parapsychology and a brief sketch of its origin and evolution. This subject can also be identified as the study of metaphysical conditions beyond the scope of human senses. Parapsychology, which has a history of about 150 years, can be identified as a popular subject that is expanding rapidly in higher education institutions in many countries of the world, especially at present. This subject, which started in the United States America, then spread to Europe and the countries of the Eastern and Western regions. Scientific research laboratories have been established for this purpose and scientific research has also been conducted there. In the United States of America as well as in European countries, various societies have been

1 පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.

established conducting research in Parapsychology. Modern Parapsychology is very much connected to the field of scientific research and the establishment of scientific research laboratories through the establishment of various associations to develop this subject, Such facts were particularly responsible for the advancement of this subject.

**Keywords:** Early Buddhism, Buddhist Psychology, Western Psychology, Parapsychology

**'අධිමානෝ විද්‍යාව' වචන විග්‍රහය**

නූතන මනෝවිද්‍යා විෂයයෙහි ම එක් ශාඛාවක් 'අධිමානෝ විද්‍යාව' යනුවෙන් හඳුන්වනු ලබයි. 'අධිමානෝ විද්‍යාව' විෂයක්ෂේත්‍රය සඳහා ඉංග්‍රීසි භාෂාවෙන්' *Parapsychology* යන වචනය භාවිත වෙයි.[2] ඉංග්‍රීසි බසින් දැක්වෙන *"Para"*යන උපසර්ගයට ප්‍රධාන අර්ථ දෙකකි.

- '*Para medical services*'යන ඉංග්‍රීසි වචනය තුළ ගැබ්ව ඇත්තේ "සහායක" යන අර්ථයයි. වෛද්‍ය විද්‍යා සේවාවට සහය වන විකිරණ සේවා, පරීක්ෂණ සේවා යනාදිය මෙයින් අදහස් කෙරේ.

- '*Para military forces*'යන ඉංග්‍රීසි වචනය තුළ ගැබ්ව ඇත්තේ ඉහත අර්ථයට මුළුනින්ම වෙනස් "අනියම්" යන අර්ථයයි. අනියම් හමුදා සහ ප්‍රධාන හමුදා අතර සම්බන්ධයක් නොවේ. එසේම අන්‍ය හමුදාවල කාර්යභාර්ය ද ප්‍රධාන හමුදාවට අදාළ කාර්යභාර්ය නොවේ. එහෙත් අනියම් හමුදා යොදා ගන්නා පුද්ගලයන්ට ප්‍රධාන හමුදා වලින් ඉටු කළ නොහැකි සේවාවන් අනියම් හමුදා ලවා ඉටු කර ගැනීමට අවශ්‍ය වෙයි.[3]

2 උපාලි හිමි, මඩවල, 2011, අධිමානසික විද්‍යාව, රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ, සත්වන මුද්‍රණය, 06 පිට.

3 එදිරිසිංහ, දයා, හපුආරච්චි, ගාමිණී, 2006, කාල් රොජර්ස් සහ නූතන මනෝවිද්‍යාව, වත්මා ප්‍රකාශකයෝ, 105 පිට.

අධිමනෝ විද්‍යාව මෙම අර්ථ දෙකෙන් ම යුක්තය. සාම්ප්‍රදායික මනෝවිද්‍යාවෙන් විස්තර කළ නොහැකි විශ්වයේ ගුප්ත පැතිකඩ විග්‍රහ කර ගැන්ම පිණිස සාම්ප්‍රදායික මනෝවිද්‍යාවේ සහායක සේවා ක්ෂේත්‍රයක් ලෙස ද අනියම් සේවා ක්ෂේත්‍රයක් ලෙස ද අධිමනෝ විද්‍යාව ක්‍රියා කරයි.

**විෂය ස්වභාවය**

පුද්ගලයාගේ ඉන්ද්‍රිය සංජානන සීමාවෙන් ඔබ්බෙහි පිහිටි පාරභෞතික ප්‍රපංචයන් පිළිබඳ අධ්‍යයනය පිණිස වන විෂයක්ෂේත්‍රයක් ලෙසට ද අධිමනෝ විද්‍යාව හඳුනාගත හැකිය.[4] "භෞතික විද්‍යා විෂයන්ට හෝ මනෝවිද්‍යාවට ඍජුවම හසු නොවන එහෙත් යම් යම් අවස්ථාවල දී විද්‍යමාන වන ගුප්ත සිදුවීම්, තොරතුරු මිථ්‍යා මාර්ගවලට හසු නොවී හෙළිදරව් කර ගැන්මට කෙරෙන විද්‍යාත්මක ගවේෂණය අධිමනෝ විද්‍යාව වශයෙන් හැඳින්වේ."[5] මඩවල උපාලි හිමියන් මේ සඳහා 'අධිමානසික විද්‍යාව' යන යෙදුම භාවිතා කරයි.[6] අධිමානසික විද්‍යාව යනු මනෝවිද්‍යාත්මක අවස්ථාවන් පිළිබඳ අධ්‍යනයක් වන අතර එය පිළිගත හැකි සංකල්පයන් මෙන්ම වර්තමාන විද්‍යාත්මක දැනුමෙන් විස්තර කළ නොහැකිය.[7] අධිමනෝ විද්‍යාවේදී සාකච්ඡාවට ගැනෙන්නේ දිවැස, පරසිත් දක්නා නුවණ, චිත්ත බලය හෙවත් සයිකෝසියාව, අතීන්ද්‍රිය ඥානය යන ඒවාගේ ක්‍රියාදාමයන්ය. එම විෂයන් විද්‍යාත්මකව ද අධ්‍යයනය කළ නොහැක. අධිමනෝ විද්‍යාව යන පාරිභාෂික වචනය ගත් කළ එහි තිබෙන්නේ මනෝවිද්‍යාවෙන් ඔබ්බට ගිය ස්වභාවයකි. මේ ගැන විවිධ අදහස් මනෝ විද්‍යාව පිළිබඳ පර්යේෂණ කරන විද්වත්හු ප්‍රකාශ කරති. එය මනෝ විද්‍යා විෂය ක්ෂේත්‍රයෙන් බාහිරව ඇති

4 Society for Psychical Research – [Brochure]

5 මලලසේකර ඉංග්‍රීසි සිංහල ශබ්ද කෝෂය, 1997, ගුණසේන ප්‍රකාශන (නව සංස්කරණය), 632 පිට.

6 Stratton.P.,Hayes. N. 1991, A Student's Dictionaty of Psychology, Universal book stall, New Delhi"p. 133.

7 The study of mental powers that apparently exist but that cannot be explained by current scientific knowledge" Oxford Advanced Learners dictionary,(1998) Oxford University Press, p. 840.

දෙයක් බව සමහරුන්ගේ මතයයි.[8] මලලසේකර ශබ්දකෝෂයේ පරාමනෝ විද්‍යාව"අධිමනෝවිද්‍යාව' යන අර්ථයෙන් මෙම විෂය භාවිතා කොට ඇත. 'මනෝ විද්‍යාව-පාරිභාෂික ශබ්ද මාලාවෙහි' අධිමානසික විද්‍යාව *'Metapsychology'* ලෙස නම් කොට ඇත. එමෙන්ම ඊට සම්බන්ධ අනෙකුත් පදයන් වන "අධිමානසික" යන පදය *'Metapsychies'* නමින් ද "අධිමානසිකය" යන්න *'Metapsychosis'* යනුවෙන් ද නම් කොට ඇත.[9] ඉංග්‍රීසි සිංහල මනෝවිද්‍යා ශබ්ද කෝෂයෙහි "අධිමානසික විද්‍යාව-පරසිත් දැනීම හා දිවැස් ලැබීම වැනි ප්‍රපංචයන් හා සම්බන්ධ වූ"[10] යන අර්ථයෙන් භාවිතා කොට ඇත.

වර්ෂ 1908 සෝවියට් විද්‍යාඥ නෝම් කොතික් අධි මානසික විද්‍යාව "මනෝ භෞතික ශක්තිය (*psychosocial Energy*) වශයෙන් දක්වන ලදි. මහාචාර්ය ඒ. එස්. ඩබ්ලිව් ට්‍රොම්ප් එය 'මනෝ භෞතික විද්‍යාව' යනුවෙන් හඳුන්වන ලදි. ෆර්නාර්ඩ් ක්ලාක් විසින් *'Psychotronics'*[11] යනුවෙන් එය හඳුන්වන ලදි. සමහර අධිමානසික විද්‍යාඥයින් පරා මනෝවිද්‍යාව, මනෝ ජෛව භෞතික විද්‍යාව යනුවෙන් මනස සහ භෞතික යන විෂයන් දෙක ම එක් කරමින් හඳුන්වා දී ඇත. මෙයට හේතු වී ඇත්තේ වර්තමාන විද්‍යා දැනුම් සම්භාරය මිණුම් දණ්ඩක් කරගැනීමෙන් පරා මානසික

8 "The study of phenomena which resemble psychological events but which are not explainable by any accepted principles. Parapsychology claims such as telepathy, psychokinesis, clairvoyance, and extra sensory perception. All of these have the characteristic that they cannot be reliably reproduced under controlled comdition and are therefore very difficult to study scientifically.The term parapsychology is accurate that means'beyond psychology' but whether that will turn out to mean that it goes further, or just that it is outside the scope of psychology is a matter of opinion at present" -Soceity of Psychical Research Broucher.

9 Glossary of Technical Terms – Psychology, 1974, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 98 පිට.

**10** මාලගොඩ, නන්දලාල්, 2007, මනෝවිද්‍යා ශබ්ද කෝෂය (ඉංග්‍රීසි - සිංහල), සරසවි ප්‍රකාශකයෝ, 893 පිට.

11 A particular branch of parapsychology which supposes an energy or force to emanate from living organisms and affect matter.

(*Parapsychological*) පරා ප්‍රතිමානිත (*Paranormal*)[12] සහ අධි ස්වභාවික (*Super Natural*) සංසිද්ධීන් විග්‍රහ කිරීමට යන්ත දැරීමයි.[13]

විශ්වකෝෂයෙහි (*Encyclopaedia*) මේ පිළිබඳ අර්ථ විවරණ දක්වමින් "මානසික පර්යේෂණ (*Psychical Research*) හෙවත් අධි මනෝවිද්‍යාව (*parapsychology*), මනෝවිද්‍යාත්මක හෝ කායිකවිද්‍යාත්මක න්‍යායන් හෝ ක්‍රම ඔස්සේ පැහැදිලි කර නොහැකි, විස්තර කර හෝ හඳුනාගත නොහැකි මානසික ශක්‍යතාවයන් පිළිබඳ විෂයක්ෂේත්‍රයක් ලෙස අර්ථ දක්වා ඇත. එම හැකියාවන් අධ්‍යාත්මික වශයෙන් ප්‍රකට වේ. අධි මනෝවිද්‍යාඥයින් විසින් මේ පිළිබඳ මනෝප්‍රපඤ්ච ද්විත්වයක් ප්‍රකාශ කරණු ලබයි. එනම්, අතීන්ද්‍රිය ප්‍රත්‍යක්‍ෂය සහ මනෝචලනය වශයෙනි."[14]

තවද "සම්මත විද්‍යා ගවේෂණවලට පරිබාහිර වූ (*Paranormal*) මනෝවිද්‍යාත්මක ප්‍රපඤ්චයන් වන දූරඥානය හෙවත් පරචිත්තවිජානන ඥානය (*telepathy*)[15], දිවැස (*clairvoyance*)[16] සහ මනෝචලනය (*psychokinesis*)[17] පිළිබඳ පර්යේෂණයන් මඟින් තොරතුරු සෙවීමේ ක්‍රමවේදය අධිමානසික විද්‍යාව වේ."[18]

12 denoting events or phenomena such as telekinesis or clairvoyance that are beyond the scope of normal scientific understanding.

**13** අන්ද්‍රාදී, රන්ජන් කුමාර, 1993, අධිමානසික ලාභීන් හා පරාමනෝවිද්‍යාව, (හැඳින්වීම) කතෘ ප්‍රකාශන.

14 "**Psychical Research or parapsychology,** the study of certain mental abilities that cannot be explained by the recognized that cannot be explained by the laws of psychology or physiology. Such abilities are often called psychic. and in the past were commonly thought to be supernatural. Parapsychologist investigate two general classes of psychic phenomena" -The Society for Psychical Research, founded in London 1890 was the first important group devoted to the study of parapsychology.in 1890 a chapter was stablished in the United States.

15 The supposed communication of thoughts or ideas by means other than the known senses.

16 The supposed faculty of perceiving things or events in the future or beyond normal sensory contact.

17 The supposed ability to move objects by mental effort alone.

18 "A field of study concerned with the investigation of evidence for Paranormal psychological phenomena (as telepathy, clairvoyance,

හුදු විද්‍යාත්මක දැනීම මේ සඳහා ප්‍රමාණවත් නොවේ.[19] මෙම පාරමනෝවිද්‍යා විෂය ස්වභාදහමේ හා විද්‍යාවේ හඳුනාගත් පරාසයන් අභිබවා සිටියි."[20] මැක්මිලන් ශබ්ද කෝෂය "සාම්ප්‍රදායික විද්‍යාවෙන් පැහැදිලි කරගත නොහැකි අසාමාන්‍යය මානසික හැකියාවන් පිළිබඳ අධ්‍යයන විෂය පාරමනෝවිද්‍යාවයි."යනුවෙන් නිර්වචනය කර ඇත. (*the study of unusual mental abilities that cannot be explained by traditional science*)[21]

පාරමනෝවිද්‍යාවෙහි අන්තර්ගතය කෙටියෙන් හඳුනාගැනීමට මනෝවිද්‍යාඥ කෙවින් බෙවර්ගේ (*Kevin Brewer*) නිර්වචනය ඉතා වැදගත් වේ. "එහි දී 'පාරමනෝවිද්‍යාවෙහි' කායිකමය අනුභූතීන්ගෙන් පරිබාහිර වූ වස්තු (ඇස, කණ, නාසාදියට සාමාන්‍ය ලෝකයේ ගෝචර වන දෙයින් පරිබාහිර දේවල් ) අන්තර්ගත වේ. (*OBES- out-of-body experiences* ). උදාහරණ ලෙස, දිව්‍යමය ප්‍රක්ෂෙපනයන්, මරණාසන්න අත්දැකීම් (*NDE- near-death experiences*), (සංචරණය වන්නාවූ) දිවැස (*clairvoyance*), භූතාත්ම (*poltergeists*)ආදිය දැක්විය හැකිය. සාමාන්‍යයෙන් එහි දී ජ්‍යොතිෂ්‍යය විෂය, අන්‍ය (පිටස්තර) අපහරණයන්, අද්භූත වූ සත්ව විද්‍යාත්මක දේ අන්තර්ගත නොවේ."[22]

---

and psychokinesis)" -Dictionary of Merriam-Webster, An Encyclopaedia Britannica Company, (Internet Source)

19 "…telepathy, clairvoyance, and psychokinesis, therein explicable by science" -the Free Dictionary by Farlex, parapsychology (Internet Source)

20 "...seem to go against or be outside the known laws of nature and science" -Cambridge Dictionaries online, parapsychology (Internet Source)

21 Macmillan Dictionary, parapsychology, (Internet Source)

22 "Parapsychology may also include out-of-body experiences (OBEs) - eg: astral projection; near-death experiences (NDE); travelling clairvoyance; poltergeists. It does not usually include astrology, UFOs and alien abductions, and cryptozoology (eg: Loch Ness monster)." Brewer, Kevin, 2001, An Introduction to Parapsychology, Orsett Psychological Services, UK, p. 04.

**විකාශය**

අධිමානසික විද්‍යාව නමින් විෂයක් බිහිවීම පිණිස මුල් වූ මූල බීජයන් සොයන විට පෙනෙන්නේ 'ලොව වරින් වර දෘශ්‍යමාන වන්නා වූ ගුප්ත සිදුවීම් වලට හේතු සෙවීමට මිනිසා තුළ වූ අසීමිත කුතුහලය' ඊට මුල් වී ඇති බවයි. "විවිධ ආගම් විවරණය කරන්නා වූ මෝක්ෂය, අපාය, දිව්‍ය ලෝකය, යක්ෂයන්, භූතයන්, මරණින් මතු පැවැත්ම, පුනර්භවය බඳු ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂයට හසු නොවන්නා වූ ඉගැන්වීම් අධිමානසික විද්‍යාවේ ප්‍රභවය විෂයෙහි පාදක වූ බවට සැක නැත."[23]

"චිකාගෝ විශ්වවිද්‍යාලයේ ජාතික උපදේශන පර්යේෂණ මධ්‍යස්ථානයෙහි පර්යේෂණ වාර්තාවන් අනුව ඇමෙරිකානුවන් වැඩි පිරිසක් වරක් හෝ දෙවරක් ඇතැම් විට ඊටත් වැඩි ප්‍රමාණයක් අධිමානසික සිදුවීම් වලට මුහුණ පා ඇත."24 අනෙක් රටවල ද තත්වය එබඳුය. සිහින සැබෑවීම් මෙන් ම ස්වයං ජනිත අතීන්ද්‍රිය ඥාන තත්වයන් හරහා ලබන දැනීම් මඟින් විවිධ පණිවිඩ සංඥා ලැබූ පුද්ගලයන් ද බොහෝ සිටී. "එක්තරා සන්ධ්‍යාවක සවස හයට ගොතෙන්බර්ග් නගරයේ දී යහළුවන් සමඟ ආහාර ගනිමින් සිටි එක් පුද්ගලයෙකු භයානක ගින්නක් හටගෙන ඇති බව පැවසීය. ඒ නගරය පිහිටියේ ඔහු සිටි තැනින් සැතපුම් 300 ක් පමණ දුරකිනි. ටික වේලාවකට පසු එම ගින්න තම අසල්වැසියෙකුගේ ගෙය දවා ඇති බවත් තමාගේ ගෙය දැවීමට තර්ජනය කරමින් පවත්නා බවත් හේ කියා සිටියේය. එදින ම රාත්‍රී අටට ඔහුගේ ගෙයින් තුන්වන ගෙය ළඟ දී ගින්න නතර කරන ලද බව ඔහු කීවේ තරමක් සැනසිල්ලකිනි. දවස් දෙකකට පසුව ගින්න පිළිබඳ සත්‍යය වාර්තා වලින් ඔහු කියූ හැම දෙයක් ම සත්‍යය බව ස්ථිර කරන ලදි. ගින්න ඇවිලෙන්නට පටන් ගෙන ඇත්තේ හරියටම ඔහුට ඒ සංඥාව ඇති වූ අවස්ථාවෙහිය."25 මෙවැනි අත්භූත කරුණු

23 තිලකරත්න, ඒ. කේ. 2001, බුදු සමයෙහි විග්‍රහ වන පාරභෞතික සිද්ධාන්ත, ශ්‍රී ප්‍රඥාරාම බෞද්ධ සංස්කෘතික කේන්ද්‍රය, 9-16 පිටු.

24 Lethvridge T. C, 1965, Beyond time and distance, London.

25 සුමංගල හිමි, කන්නිමහර, 2013, සංසාර මන්දිර, රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ, 37 පිට.

පදනම් කරගන්මින් මෙම විෂය පිළිබඳ ඇති වූ කුතුහලය නිසා උක්ත කරුණුවල පසුබිම සෙවීමෙහි යෙදුණු පර්යේෂකයෝ ස්වකීය පර්යේෂණ හරහා අධිමානසික විද්‍යාවේ විකාශය හා සංවර්ධනය කෙරෙහි විශාල දායකත්වයක් ලබා දුන්හ.

බටහිර අධිමානසික විද්‍යාවේ ප්‍රාරම්භක අවධිය ලෙස 1730 - 1880 අතර කාලය දැක්විය හැකිය. මෙස්මර් නම් පර්යේෂකයා හස්ත ස්පර්ශයෙන් රෝග සුවපත් කිරීමේ ක්‍රමයක් මෙස්මරිසම් නමින් හඳුන්වා දෙන ලදි. 1784 දී ඔහුගේ ගෝලයෙකු වූ පීස්ගිවූර් විසින් මෝහන ක්‍රමය (*Hypnotism*) දියුණු කරන ලදි.[26] මෝහන නිද්‍රාව තුළින් දිවැස් වැනි අතීන්ද්‍රිය ශක්තීන් අවදිකොට ගත හැකි බැව් ඔහු එමඟින් දක්වන ලදි. ඉන් අනතුරුව James Braid, Sigmund Freud වැනි පර්යේෂකයන් විසින් මෙම විෂය ක්ෂේත්‍රය දියුණු කරන ලදහ.

ශ්‍රීමත් විලියම් කෲස් වැන්නවුන් '*Spiritilism*'[27] හෙවත් භූත විද්‍යාව[28] පිළිබඳව ද බොහෝ පර්යේෂණයන් සිදු කර ඇත. පාලු නිවෙස් තුළ සිදුවන අදෘශ්‍යමාන සිදුවීම් ආදිය ඊට පදනම් වූ අතර භූත සංනිවේදනය එම පර්යේෂණයන්හි ප්‍රධාන අංගයක් විය. ෆොක්ස් පවුලේ භූත සිද්ධීන් එවැනි එක් සිද්ධියක් පමණි. ඩී.ඩී. හෝම් වැනි අධිමානසික හැකියාවන්ගෙන් යුක්ත වූවන් අළලා සිදු කළ අධ්‍යයනයන් තුළින් උද්යෝගයට පත් ශාන්ත පීයර්ස්බර්ග් විශ්වවිද්‍යාලයේ අධිමානසික සංගමය 1875 දී ඒ පිළිබඳ කොමිසමක් ද පත් කරන ලදි.

26 Modern-day **hypnosis**, however, started in the late 18th century and was made popular by Franz Mesmer, a German physician who became known as the father of 'modern **hypnotism**'. In fact, **hypnosis** used to be known as 'Mesmerism' as it was named after Mesmer.

27 A system of belief or religious practice based on supposed communication with the spirits of the dead, especially through mediums.

28 The doctrine that the spirit exists as distinct from matter, or that spirit is the only reality.

1882 දී ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලීය උගතුන් එක්ව 'මානසික පර්යේෂණ පිළිබඳ බ්‍රිතාන්‍ය සමාජය' (*British Society for physical Research*) නමින් සංගමයක් පිහිටු වූ අතර අධිමානසික විද්‍යාවේ පුරෝගාමියෙකු වූ (*Frederic W. H. Myers)* ෆෙඩ්රික් මයර්ස් එහි ප්‍රථම සභාපතිවරයා ලෙස ද ඔක්ස්ෆර්ඩ්හි උපකුලපතිවරයෙකු වූ එච්.එච්. ප්‍රයිස් (*H.H Price*) එහි දෙවන සභාපතිවරයා ද විය. විලියම් බැරට් එහි ක්‍රියාකාරී පුරෝගාමිකයෙකු විය. [29] මෙම සංකල්පයේ මුල් අරමුණු අතර '*Telepathy*' පිළිබඳ පර්යේෂණයන් සිදු කිරීමත් අධ්‍යාත්මික සංකල්ප හඳුන්වා දීමේ දෘෂ්ටියක් ගොඩ නැංවීමත් ප්‍රමුඛ වේ. එමෙන් ම සුප්‍රකට ස්නායු වෛද්‍ය මෝහන ප්‍රතිකාරක ජීන් චාකෝ (*Jean Charcot*)චාල්ස් රිෂේ (*Charles Rechte*) හා දාර්ශනික හෙන්රි සිජ්වික් (*Sidgwick*) ආදී උගතුන් එක්ව 'ප්‍රංශ සංගමය' නමින් අධිමානසික සංගමයක් පිහිටුවා ගන්නා අතර අධිමානසික ක්‍රියාකාරකම් පිළිබඳව ශාස්ත්‍රීය ඥාන ගවේශණය මෙන් ම එම ක්ෂේත්‍රයට අයත් සංකල්ප බිහිවීම ද මෙකල තව දුරටත් වර්ධනය විය.

---

29 The Society for Psychical Research (SPR) originated from a discussion between journalist Edmund Rogers and the physicist William F. Barrett in autumn 1881. This led to a conference on 5 and 6 January 1882 at the headquarters of the British National Association of Spiritualists which the foundation of the Society was proposed. The committee included Barrett, Rogers, Stainton Moses, Charles Massey, Edmund Gurney, Hensleigh Wedgwood and Frederic W. H. Myers. The SPR was formally constituted on 20 February 1882 with philosopher Henry Sidgwick as its first president. The SPR was the first organization of its kind in the world, its stated purpose being "to approach these varied problems without prejudice or prepossession of any kind, and in the same spirit of exact and unimpassioned enquiry which has enabled science to solve so many problems, once not less obscure nor less hotly debated." Other early members included the author Jane Barlow, the renowned chemist Sir William Crookes, physicist Sir Oliver Lodge, Nobel laureate Charles Richet and psychologist William James.

1857 දී යුරෝපයේ ප්‍රථම අධිමනෝවිද්‍යා ග්‍රන්ථය වූ 'භූත ආත්ම' නම් ග්‍රන්ථය (*The Spirits Book*) නමින් ප්‍රංශ ජාතික (*Alan Kardec on April* 18, 1857) කාර්ඩෙක් විසින් පළ කොට මුද්‍රණය කරන ලදි. එමෙන් ම මෙම වර්ෂයේදී ම හෙන්රි බර්ග්සන් (*Bergson* 1859–1941)[30], තෝමස් ජේ. හඩ්සන් ආදී අධිමානසික විද්‍යා පර්යේෂකයන් ලියූ ග්‍රන්ථවල ද පළමු වරට අතීන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය (*Extra Sensory perception – ESP*) පිළිබඳ තොරතුරු වාර්තා විය. එඩ්මන් ගර්නි විසින් ද ශරීරයෙන් පිටත අනුභූතීන් (*Body Experience - OBE*) නමින් යුරෝපයේ වාර්තා වූ එවැනි සිදුවීම් 350 ක් අළලා ලියූ ග්‍රන්ථයන් ද අධිමානසික විද්‍යාව හා සම්බන්ධ වැදගත් පාරිභාෂික පදයන් දෙකක් ද භාවිතා විය. එනම් 'අභ්‍යවකාශ ප්‍රක්ෂේපය' (*Astral Project*) සහ 'අභ්‍යවකාශ චාරිකා' (*Astral Travel*) යන පදයන් ය.

**විද්‍යාත්මක පර්යේෂණ සිදුකිරීම**

භෞතික විද්‍යාවේ සිද්ධාන්තවලට සපුරා පටහැනි අධිමානසික තත්වයන් පිළිබඳ මනෝවිද්‍යාඥයින්ගේ දැඩි අවධානයට යොමු වීම නිසා මීට විසඳුම් සෙවීමේ අරමුණින් වර්ෂ 1870 දී ඔලිවර් ලොජ්

30 Henri Bergson (1859–1941) was one of the most famous and influential French philosophers of the late 19th century-early 20th century. Although his international fame reached cult-like heights during his lifetime, his influence decreased notably after the second World War. While such French thinkers as Merleau-Ponty, Sartre, and Lévinas explicitly acknowledged his influence on their thought, it is generally agreed that it was Gilles Deleuze's 1966 *Bergsonism* that marked the reawakening of interest in Bergson's work. Deleuze realized that Bergson's most enduring contribution to philosophical thinking is his concept of multiplicity. Bergson's concept of multiplicity attempts to unify in a consistent way two contradictory features: heterogeneity and continuity. Many philosophers today think that this concept of multiplicity, despite its difficulty, is revolutionary. It is revolutionary because it opens the way to a preconception of community.

සහ විලියම් බැරට් ආදී විද්වත්හු 'පරචිත්ත විජානන ඥානය පිළිබඳ' කරුණු ඒකරාශී කිරීමේ සංසදයක් ද ආරම්භ කළහ.[31]

අධිමානසික විද්‍යාවේ ගවේෂණ අවධිය 1880 - 1930 අතර කාලය තෙක් දිවයන අතර 1888 දී මානසික පර්යේෂණ සඳහා සමාජය (*Society for Psychical Research*) නම් සංගමය එංගලන්තයේ දී පිහිටුවනු ලැබීය. එහි මුඛ්‍ය අරමුණ වූයේ අධිමානසික සිදුවීම් මිථ්‍යා මාර්ග වලට හසු නොවී විද්‍යානුකූලව විවරණය කර ගැනීමයි. හෙන්රි සිඩ්වක්, සී. බී. බ්රෝඩ්, හෙන්ර් බර්ග්සන්, එච්. එච්. ප්‍රයිස්, අගමැති ඒ. ටී. බල්පෝ හා මනෝවිද්‍යාඥ විලියම් ජේම්ස්, ශ්‍රීමත් විලියම් කෲස් ආදීන් එහි පුරෝගාමීන් විය. මෙම සංගමය මඟින් අධිමානසික විෂය සම්බන්ධ සඟරාවන් නිකුත් කරමින් විශාල ජන ප්‍රබෝධයක් ඇති කළ අතර විවිධ අධිමානසික පර්යේෂණාගාරයන් ද ලොව පුරා බිහි කිරීමට එමඟින් අඩිතාලම වැටුණි. එඩින්බර්ග්හි මනෝවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධිමානසික අංශය, ලන්ඩන් නුවර අධිමානසික විද්‍යාලය, වේල්ස්හි ජාත්‍යන්තර අධිමානසික ආයතනය විල්සයර්හි අධිමානසික විද්‍යාගාරය ඊට නිදසුන් වේ.

එමෙන් ම සිතකින් සිතකට පණිවිඩ හුවමාරුව පිළිබඳව ද (*Thought Transference Telepathy*) බොහෝ පර්යේෂණයන් සිදු කෙරිණි.

සත්ත්ව චුම්භකත්වය (*Animal Magnetism*)[32] නම් විෂය මෙස්මර් හඳුන්වා දීමත් සමඟ යුරෝපයේ ද අධිමානසික විද්‍යාව

31 අති පූජ්‍ය. වේවැල්ලව අනුරුද්ධ නාහිමි අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය, 2015, බෞද්ධ මනෝ විද්‍යාව, ඒ. එස්. කලුආරච්චිඃ සංස්කරණය, ආචාර්ය වසන්ත ප්‍රියදර්ශන, පාලි හා බෞද්ධ අධ්‍යයන ප්‍රකාශන ආයතනය, 355 පිට.

32 ඉංග්‍රීසියෙන් පරිවර්තනය කළ සත්ව චුම්භකත්වය යනු 18 වන සියවසේ දී ජර්මානු වෛද්‍ය ෆ්‍රාන්ස් මෙස්මර් විසින් මිනිසුන් හා සතුන් ඇතුළු සියලු ජීවීන් සතුව ඇති අදෘශ්‍යමාන ස්වභාවික බලවේගයක් යැයි විශ්වාස කළ නමයි **Animal magnetism**, also known as mesmerism, was the name given by German doctor Franz Mesmer in the 18th century to what he believed to be an invisible natural force (Lebensmagnetismus) possessed by all living things, including humans, **animals**, and vegetables.

පැතිර ගියේය. ඉන් අනතුරුව මෝහන නිද්‍රාව පිළිබඳ සිදු කළ පර්යේෂණයන්හි තවත් එක් සාර්ථක ඉදිරි පියවරක් ලෙස ස්වීඩනයේ සුභසාධක සංගමය (*Swedish Society for Exegesis and Philanthropy*) විසින් මැස්මර්ගේ න්‍යාය ගවේෂණය කරමින් මෝහන නිද්‍රාවට පත් අයෙකුගේ සහයෝගයෙන් රෝග සුවපත් කළ හැකි බැව් තහවුරු කරන ලදි. මෙස්මර් ඇති කළ නූතන භූත විද්‍යාවේ පදනම ප්‍රංශයේ එල්. ඒ. කානට් හා එච්. රිවෙල් යන පර්යේෂකයන් දෙදෙනා විසින් තවදුරටත් ඉදිරියට ගෙනයන ලදහ.

මෙකල රුසියානු පර්යේෂකයෝ ද අධිමානසික විද්‍යා පර්යේෂණ කෙරෙහි වැඩි අවධානය යොමු කළහ. වර්ෂ 1875 ශාන්ත පෙටර්ස්බර්ග් විශ්වවිද්‍යාලයේ (*University of St. Petersburg*) භෞතික විද්‍යා සංගමය (*Physical Society*) අධිමානසික සිද්ධීන් ගවේෂණය කිරීමට පෙළඹුණි. රීබස් (*Rebus*) නම් සඟරාව තුළින් ද ඔවුහු විශාල තොරතුරු ප්‍රමාණයක් ජනතාව වෙත රැගෙන ගියෝය. මානසික රෝගීන් අරභයා ඒ. එන්. නොව්රින් (*A.N. Novrin*) නම් පර්යේෂකයා විසින් රැස් කළ තොරතුරු සත්‍යය බව අධිසංවේදී මානසික රෝගයකින් පීඩාවට පත් කාන්තාවකගේ ප්‍රකාශයක් හරහා සනාථ විය. 1889 දී පැරිස්හි ජාත්‍යන්තර මට්ටමේ අධිමානසික විද්‍යා සමුළුවක් පැවැත් වූ අතර හිප්නෝටිසම් (*Hypnotism*) පිළිබඳ උපන්‍යාස දෙකක් ගැන එහි දී අවධානය යොමු විය.

1894 දී *'Ensus of Hallucination'* නම් ග්‍රන්ථය ද මෙවැනි ම අත්දැකීම් පිළිබඳ ලියූ එක් ග්‍රන්ථයකි. ප්‍රයිස් මෙලෙස අවකාශයට නිකුත් වෙන පුද්ගලයාගේ ශරීරය *'Etheric Body'*[33] නමින් හඳුන්වන ලදි. මෙය ද ටෙලිපති ස්වරූපයකි. 'ඊතර්' යනු ද්‍රව්‍ය හා විඥානය අතරමැද තත්වයකි.1890 දී තෝමස් ජේ. හඩ්සන් (*Thomas J. Hudson*) දුරස්ථ සුව කිරීම (*Distant Healing*) යන සංකල්පය ප්‍රථම වතාවට ඉදිරිපත් කරන ලදි. එයින් සිදු වන්නේ

33 The etheric body, ether-body, æther body, a name given by neo-Theosophy to a vital body or subtle body propounded in esoteric philosophies as the first or lowest layer in the "human energy field" or aura. It is said to be in immediate contact with the physical body, to sustain it and connect it with "higher" bodies.

අධිමානසික හැකියාවෙන් රෝගීන් සුවපත් කිරීමය. ආත්මයික මනසින් (*Subjective mind*)[34] මෙය සිදු කෙරෙයි.

1893 දී 'හඩ්සන්' නම් පර්යේෂකයා විසින් මානසික (*psychic*)[35] යන පදය වෙනුවට මනෝමය යන අර්ථය සහිත (*Mental*) යන පදය ආදේශ කලේය. 1903 දී මයර්ස් නම් පර්යේෂකයා විසින් අධිමානසික විද්‍යා සංකල්ප රැසකට නව පාරිභාෂික පද සැපයීම ද සිදු කරන ලදි. ආවේගය (*Trance*) යන පදය වෙනුවට මනෝචාලක ස්වයංක්‍රීයවාදය (*Motor Automatism*) යන්න ද, යකැදුරු (*Exorcist*) යන පදය වෙනුවට මාධ්‍ය (*Medium*) යන්න ද, ආවේශ ක්‍රියාවලිය හැඳින්වීම පිණිස මධ්‍යභාවය (*Mediumship*) යන්න ද ඔහු විසින් හඳුන්වා දෙන ලද පාරිභාෂික පද වේ.[36] ඇමෙරිකාවේ භූතාත්ම පිළිබඳ 19 වන සියවස අග භාගයේ ඇති වූ උනන්දුවෙහි ප්‍රතිඵලයක් ලෙස එංගලන්ත අධිමානසික විද්‍යා සංගමයේ ශාඛාවක් 1986 දී ඇමරිකා එක්සත ජනපදයේ පිහිටුවීය. පසුකලෙක '*American Society for Psychical Research* (ASPR)'[37] යනුවෙන් වෙනම සංවිධානයක් ද එහි බිහි විය.

---

34 **Subjective mind** is open to dialogues, amalgamation of ideas and presents a generic world view that may clash with other person's **subjective** opinions. Objective **mind**, on the other hand, is bound to (mostly) physical properties of the object, given to oneness of the view and devoid of any individual interpretations.

35 relating to or denoting faculties or phenomena that are apparently inexplicable by natural laws, especially involving telepathy or clairvoyance.

**36** හපුආරච්චි, ගාමිණී, (2013) ව්‍යවහාරික මනෝවිද්‍යාව, සුසිත ප්‍රකාශන, ප්‍රථම මුද්‍රණය, 251 පිට.

37 The **American Society for Psychical Research (ASPR)** is the oldest psychical research organization in the United States dedicated to parapsychology. It maintains offices and a library, in New York City, which are open to both members and the general public. The society has an open membership, anyone with an interest in psychical research is invited to join. It maintains a website; and publishes the quarterly *Journal of the American Society for Psychical Research*.

වර්ෂ 1922 දී කොපන්හේගන්හි කාල්වේට් නම් පර්යේෂකයාගේ ප්‍රමුඛත්වයෙන් ප්‍රථම අධිමානසික විද්‍යා සම්මන්ත්‍රණයක් පැවැත්විය. එය එතරම් සාර්ථක නොවුන ද 1923 හි වෝර්සෝ නගරයේ දී පැවැත්වූ දෙවන සම්මත්ත්‍රණය පළමුවැන්නට වඩා සාර්ථක විය. 1953 හි දෙවන ලෝක සංග්‍රාමයෙන් පසු මහාචාර්ය ගාඩ්නර් මර්ෆාගේ ප්‍රධානත්වයෙන් නෙදර්ලන්තයේ අර්ට්රිච් (*Utrecht*) විශ්වවිද්‍යාලයේ පැවැති ජාත්‍යන්තර අධිමානසික විද්‍යා සම්මන්ත්‍රණයේ දී සාකච්ඡා වූයේ මරණින් මතු පැවැත්ම හා භූත ආත්ම පිළිබඳ තොරතුරුය.[38]

මහාචාර්ය විලියම් මැග්ඩුගල් ඩියුක් 1927 විශ්වවිද්‍යාලයට පීඨාධිපති වශයෙන් තේරී පත්වීමෙන් අනතුරුව විශාල සේවාවක් මෙම ක්ෂේත්‍රයට සිදු කලෙය.[39] ඇමරිකා එක්සත් ජනපදයේ විලියම් ජේම්ස්, නෙදර්ලන්තයේ ජී. හේමන්ස් හා එක්සත් ජනපදයේ විලියම් මැග්ඩුගල් ස්වකීය විශ්වවිද්‍යාලීය දෙපාර්තමේන්තු තුළ ම අධිමානසික විද්‍යාවට අයත් මූලික සංකල්ප වන චිත්ත සංචරණය (*Telepathy*), දූරචිත්ත ඥානය (*Clairvoyance*),අනාගතය දැකීමේ ඥානය (*Precognition*)ආදී සංසිද්ධීන් පිළිබඳ අධ්‍යයන කටයුතු අරඹා ඇත. සෝවියට් රුසියාව, බල්ගේරියාව, චෙකෝස්ලෝවේනියාව, එක්සත් රාජධානිය, ආදි රටවල සිටි මෙම ක්ෂේත්‍රයට අදාළ වියතුන් විසින් ද විවධ සංගම් පිහිටුවාගෙන පර්යේෂණ රැසක් සිදුකරමින් මෙම විෂය පොෂණයට විශාල සේවාවක් සිදු කරන ලදහ.[40]

ජේ. බී. රයින්, අධිමානසික පර්යේෂණාගාරයක් පිහිටුවාගෙන අතීන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය පිළිබඳ ගැඹුරින් හදාළේය. එසේම ඔහු විසින් 'ESP කාඩ්පත් පරීක්ෂණ' නම් පරීක්ෂණ ක්‍රමයක් ද *Extra Sensory Perception* නමින් අගනා කෘතියක් ද රචනා කරන ලදි. එමෙන්ම

**38** එදිරිසිංහ දයා, හපුආරච්චි, ගාමිණී, 2006, කාල් රොජර්ස් සහ නූතන මනෝ විද්‍යාව, වත්මා ප්‍රකාශකයෝ.

**39** උපාලි හිමි, මඩවල, 2011, අධිමානසික විද්‍යාව, රත්න ප්‍රකාශකයෝ, කොළඹ, 40 පිට.

**40** අති පූජ්‍ය වේවැල්ලව අනුරුද්ධ නාහිමි අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය, (2015) බෞද්ධ මනෝවිද්‍යාව, ඒ. එස්. කලුආරච්චිඃ සංස්කරණය, ආචාර්ය වසන්ත ප්‍රියදර්ශන, පාලි හා බෞද්ධ අධ්‍යයන ප්‍රකාශන ආයතනය, 355 පිට.

පළමුවරට අධිමානසික විෂය ක්ෂේත්‍රය *Parapsychology* යනුවෙන් නම් කළේ ද ඔහු විසිනි. 1965 අගෝස්තු 24 දින සමස්ථ බටහිර වෛද්‍යවරු මවිතයට පත් කරමින් අධිමානසික ශක්තිය මඟින් ශරීරය නිර්වින්දනය කොට සැත්කමක් සිදු කිරීමට බල්ගේරියානු වෛද්‍ය ලෝසාහෝව්ට හැකි විය. මෙහිදී රුධිර වහනය හා ශරීරයේ කැපුම් වඩා වේගයෙන් සුවපත් කිරීම, රෝග බෝවීමේ අවධානම අවම කිරීම බඳු කායික රෝග තත්ත්වයන් සුවපත් කිරීමට හැකි බව ද සමස්ත ලෝකයට ම පෙන්වා දෙන්නට සමත් විය.[41]

## සමාලෝචනය

වර්ෂ 150 ක පමණ අධිමානසික විද්‍යාවේ ඉතිහාසය පරීක්ෂා කරනවිට එය ප්‍රධාන ව්‍යාපෘති දෙකකින් සමන්විත බව ප්‍රකට වෙයි. එනම්, 'භූත ආත්ම' සහ 'අධිමානසික' ක්‍රියාකාරකම් ය. 'භූත ආත්ම' පිළිබඳ පර්යේෂණ පළමුව ද දෙවනු 'අධිමානසික' ක්‍රියාකාරකම් පිළබඳ ව්‍යාපෘතිය ද ජනප්‍රිය වූ බවක් දක්නට ලැබේ.[42]

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

**මූලාශ්‍රය - සිංහල**

අන්ද්‍රාදී, රන්ජන් කුමාර, 1993, අධිමානසික ලාභීන් හා පරාමනෝවිද්‍යාව, (හැඳින්වීම) කතෘ ප්‍රකාශන.

උපාලි හිමි, මඩවල, 2011, අධි මානසික විද්‍යාව, රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ, සත්වන මුද්‍රණය.

එදිරිසිංහ, දයා, හපුආරච්චි, ගාමිණී, 2006, කාල් රොජර්ස් සහ නූතන මනෝවිද්‍යාව, වත්මා ප්‍රකාශකයෝ.

ඥාණසිරි, සුගතමුණි, 1991, අධිමානසික විද්‍යාව, සරසවි ප්‍රකාශන.

ප්‍රේමසිරි, පී. ඩී., ආණමඩුවේ ධම්මදස්සි හිමි, (සංස්කරණය), ප්‍රබුද්ධ ශාස්ත්‍රීය සංග්‍රහය, 1991, සමයවර්ධන, කොළඹ.

41 Gnanasiri, Sugathamuni, (2003) Psychology In Buddhist Literature, Buddhist Cultural Center, p. 66.

42 හපුආරච්චි, ගාමිණී, (2013) ව්‍යවහාරික මනෝවිද්‍යාව, සුසිත ප්‍රකාශන, ප්‍රථම මුද්‍රණය, 266 පිට.

අති පූජ්‍ය. වේවැල්ලවෙ අනුරුද්ධ නාහිමි අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය 2015, බෞද්ධ මනෝ විද්‍යාව, ඒ. එස්. කලුආරච්චිඃ සංස්කරණය, ආචාර්ය වසන්ත ප්‍රියදර්ශන, පාලි හා බෞද්ධ අධ්‍යයන ප්‍රකාශන ආයතනය.

මනෝවිද්‍යාව, 2002, තෙවන කාණ්ඩය-දෙවන කලාපය, මනෝවිද්‍යා අධ්‍යයන ආයතනය (සංස්කරණය).

තිලකරත්න, ඒ. කේ., 2001, බුදු සමයෙහි විග්‍රහ වන පාරභෞතික සිද්ධාන්ත, ශ්‍රී ප්‍රඥාරාම බෞද්ධ සංස්කෘතික කේන්ද්‍රය.

සුමංගල හිමි, කන්නිමහර, 2013, සංසාර මන්දිරය, රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ.

හපුආරච්චි, ගාමිණී, 2013, ව්‍යවහාරික මනෝවිද්‍යාව, සූසිත ප්‍රකාශන, ප්‍රථම මුද්‍රණය.

මංචනායක. අතුල, 2005, භවය, විඥානය සහ කර්ම බලය, අකිල ප්‍රකාශන, ප්‍රථම මුද්‍රණය.

රංජන කුමාර, අන්ද්‍රාදි, 1993, අධිමානසික ලාභීන් හා පරාමනෝවිද්‍යාව, කර්තෘ ප්‍රකාශන.

**මූලාශ්‍රය - ඉංග්‍රීසි**

Avalon, Arthur, 1974, ***The Serpent Power*** : The Secrets of Tantric and Shaktic Yoga, Amazon Book Publishers (introducion).

Beardsley, Monroe C**,** ***Philosophical Thinking An Introduction***, 1965, Chapter 05, Perception, Harcourt, Brace & World, 1st Edition.

Glossary of Technical Terms – ***Psychology***, (1974)Educational Publication Department, Sri Lanka

Gnanasiri, Sugathamuni, 2003, ***Psychology in Buddhist Literature***, Buddhist Cultural Centre.

J. Irwin, Harvey and A. Watt,Caroline, 2007, ***An Introduction to Parapsychology***, 4th Edition, McFarland & Company, North Carolina, and London.

Kalansuriya, A.D.P., ***Modern Western Philosophy,*** 1973, Educational Publishing Department.

Lethvridge T. C., 1965ල ***Beyond time and distance***, London.

Russell, Bertrand, *The Analysis of Mind*, 1995, T.J. Press (Padstow) Ltd, Padstow, Cornwall.

Stearn, Jess, 1971, ***Edgar Cayce The Sleeping Prophet***, Bantam Books, New York (Internet Archive).

Ven. Ñānānanda, Katukurunde, 2012, ***Concept and Reality in Early Buddhist Thought***, Buddhist Publication Society, Kandy.

**ශබ්දකෝෂ හා විශ්වකෝෂ**

**සිංහල මාධ්‍යය**

බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, 1998, පාලි සිංහල අකාරාදිය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

සෝරත හිමි, වැලිවිටියේ, 1952, ශ්‍රී සුමංගල ශබ්දකෝෂය, ප්‍රථමභාගය, මහා බෝධි යන්ත්‍රාලය, මරදාන.

පාලි ශබ්ද කෝෂය, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

මලලසේකර, ගුණපාල, 1997, මලලසේකර ඉංග්‍රීසි සිංහල ශබ්ද කෝෂයගුණසේන ප්‍රකාශන (නව සංස්කරණය).

මාලගොඩ, නන්දලාල්, 2007,මනෝවිද්‍යා ශබ්ද කෝෂය (ඉංග්‍රීසි - සිංහල), සරසවි ප්‍රකාශකයෝ.

**ඉංග්‍රීසි මාධ්‍යය**

Ven. Nyanatiloka, 1988, ***Buddhist Dictionary*** (Manual of Buddhist Terms and Doctrines), Buddhist Publication Society, Kandy ***The Free Dictionary*** by Farlex, *Abhiññā* (Internet Online Dictionary).

***The Free Dictionary*** by Farlex, parapsychology, (Internet Source) Stratton. P., Hayes. N. 1991, ***A Student's Dictionary of Psychology***, Universal book stall, New Delhi.

***New Oxford Advanced Learners Dictionary***, 2005, Oxford university Press.

Borchert, Donald M (editor in chief), ***Encyclopaedia of Philosophy***, 2006, 2nd edition, Vol. IX, Macmillan Reference USA, An imprint of Thomson Gale, a part of The Thomson Corporation

Cambridge Dictionaries online, ***parapsychology*** (Internet Source).

David's, T. W. Rhys, William Stede, 1989, ***The Pali Text Society's Pali-English Dictionary***, Manoharan Publishers Pvt. Ltd., New Delhi.

Dictionary of Merriam-Webster, ***An Encyclopaedia***, Britannica Company, (Internet Source) ***Macmillan Dictionary,*** parapsychology (Internet Source).

Michael, Medi ***A Glossary of Terms used in Parapsychology*** (Internet Sources).

Hastings, James (Editor***), Encyclopaedia of Religion and Ethics***, 1954, Vol. VI, Great Britain By Morrison and Gibb Limited.